# අශ්‍රද්ධාවන්තයෝ ශ්‍රද්ධා කථා ඇසෙන විට ගැටෙති කෝපවෙති විරුද්ධ වෙති අසතුට පළ කරති

## දුක්කථා සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 3 - පිටු අංක 294 - 299)

අශ්‍රද්ධාවන්තයා ශ්‍රද්ධා කථාව ඇසෙන විට ම කෝපයට පත්වෙයි. කිපෙයි. ව්‍යාපාදයට පැමිණෙයි. විරුද්ධ ව නැගී සිටියි. කෝපය, ද්වේෂය හා අසතුට පහළ කරයි.

ඒ කවර හෙයින් ද යත්;

තමා තුළ ඒ ශ්‍රද්ධා සම්පත් (සම්පදාය) නොදකියි. ඒ නිසා ප්‍රීතිය ප්‍රමෝදය නොලබයි.

එ හෙයින් අශ්‍රද්ධාවන්තයාට ශ්‍රද්ධා කථා දුක් කථා වෙයි.